**රත්නපුර ප්‍රාදේශීය සභාව - 2023**

**-------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

රත්නපුර ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට රත්නපුර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන

තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

### 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | | | ------------ |
| (අ) | එකතුව රු.881,136ක් වූ පුස්තකාල පොත් ඇතුළු මූලධන ස්වරූපයේ අළුත්වැඩියා වියදම් ප්‍රාග්ධනිත කර නොතිබුණු අතර රු.380,491ක උපචිත මෙහෙයුම් වියදමක් ද ගිණුම්ගත කර නොතිබුණි. | 2024 මූල්‍ය ප්‍රකාශනවලින් නිවැරදි කිරීමට කටයුතු කරමි. | නිවැරදිව ගිණුම්ගත කළයුතු වේ. |
| (ආ) | මූල්‍ය ප්‍රකාශන අනුව ගිණුම් විෂයයන් 09ක 2023 දෙසැම්බර් 31 දිනට ශේෂ සහ උපයෝගී ලේඛන අනුව එදිනට එම ශේෂ අතර රු.384,505,389ක වෙනසක් විය. | දීර්ඝ කාලයක සිට පවතින වෙනසකි. 2024 වර්ෂයේදී නිවැරදි කරමි. | වෙනස නිරවුල් කළ යුතු වේ. |

### 1.6.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| | | ------------ |
| එකතුව රු.24,558,553ක් වූ ගිණුම් විෂයයන් 10ක විස්තරාත්මක උපලේඛන හා ශේෂ තහවුරු කිරීම් ඉදිරිපත් නොවුණි. | 2024 වර්ෂයේදී මෙය නිවැරදි කරමි. | විගණනය සඳහා අවශ්‍ය තොරතුරු ලබා දිය යුතු වේ. |

### 1.7 අනුකූල නොවීම්

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි 371 (5) පරිදි, 2005, 2014 හා 2023 වර්ෂවල දී ලබා දී තිබුණු රු.917,010ක අත්තිකාරම් 10ක් පියවා නොතිබුණි. | අත්තිකාරම් පියවීම සඳහා අදාළ නිලධාරීන් දැනුවත් කර ඇත. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළයුතු වේ. |
| (ආ) | මුදල් රෙගුලාසි 571 පරිදි 2010 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා කාලයට අදාළ විවිධ තැන්පතු රු.5,839,075ක් නියාදනය කර නොතිබුණි. | 2024 වර්ෂයේදී නිවැරදි කරමි. | - එම - |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.5,664,917ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.10,425,476ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 2,940,630 | 985,330 | 975,838 | 75,000 | 2,539,784 | 1,279,385 | 1,274,251 | 66,110 |
| කුලී | 2,500,000 | 50,452 | 50,452 | - | 760,000 | 52,145 | 52,145 | - |
| බලපත්‍ර ගාස්තු | 2,240,200 | 1,176,830 | 1,176,830 | - | 1,672,200 | 1,112,750 | 1,112,750 | - |
| වෙනත් ආදායම් | 3,933,000 | 2,640,941 | 1,512,340 | - | 2,928,000 | 2,083,795 | 2,089,586 | - |
| | 11,613,830 | 4,853,553 | 3,715,460 | 75,000 | 7,899,984 | 4,528,075 | 4,528,732 | 66,110 |

#### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සංවර්ධිත ප්‍රදේශ 06 ක් 2014 ජූනි 30 දිනට හඳුනාගෙන තිබුණ ද, 2023 දෙසැම්බර් වන විටත් වරිපනම් අයකර නොතිබුණි. | නැවත සමීක්ෂණයක් සිදුකර 2025 වර්ෂයේදී වරිපනම් බදු අය කිරීමට කටයුතු කෙරේ. | නොපමාව ආදායම් රැස්කර ගත යුතු වේ. |
| (ආ) | ලියාපදිංචි ත්‍රීරෝද රථ 222කින් 178ක්ම 2023 වර්ෂයට අදාළ ගාස්තු | මෙම වර්ෂය තුළ දී සමීක්ෂණයක් සිදුකොට සාමාජිකයින් හඳුනා | - එම - |

| | | | |
|---|---|---|---|
| | රු.178,000ක් ගෙවා නොතිබුණි. | ගැනීමට කටයුතු කරමි. | |
| (ඇ) | දැන්වීම් පුවරු 63ක් සඳහා හිඟහිටි රු.608,500ක් අයකර නොතිබුණි. | දැනුවත් කිරීම් සඳහා ප්‍රතිචාර නොමැති ආයතනවල දැන්වීම් පුවරු ගලවා ඉවත් කරනු ලැබීය. | - එම - |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| “ඉ-මහජන පුස්තකාල” වැඩසටහනේ සමාරම්භක උත්සවය සඳහා 2022 මාර්තුවල රු.72,415ක් වැය කර තිබුණද, ඉන් ඉදිරියට එම වැඩසටහන ක්‍රියාත්මක කර නොතිබුණි. | ඉදිරියේදී මෙම වැඩසටහන නිසි පරිදි ක්‍රියාත්මක කිරීමට කටයුතු කරමින් පවතී. | වැඩසටහන ඵලදායී ලෙස ක්‍රියාත්මක කළ යුතු වේ. |

**3.2 අවිධිමත් ගනුදෙනු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව හා ගිවිසුම්ගතවීමකින් තොරව සභාපතිවරයාට කුලී පදනම මත 2023 වර්ෂයේදී වාහනයක් ලබා ගෙන ඊට ඉන්ධන සඳහා රු.76,950ක් වැයකර තිබුණි. කෙසේ නමුත්, එම කාලය තුළ ඔහු සභාවේ කටයුතු සඳහා සහභාගී වී නොතිබුණු අතර ගරු අධිකරණය විසින් ඔහුට එරෙහිව වරෙන්තුවක්ද නිකුත් කර තිබුණි. | එම කාලසීමාවේ සේවයේ නියුතුව සිටි සියළුම නිලධාරීන් මේ වන විට ස්ථාන මාරු වී ඇති බැවින් මේ පිළිබඳව කරුණු විමසීමෙන් පසුව ඉදිරි කටයුතු කරමි. | සිද්ධිය සම්බන්ධයෙන් විමර්ශනයක් කළ යුතු වේ. |
| (ආ) | හිදැල්ලන, වාහන සේවා කිරීමේ ස්ථානයක් ඉදිකිරීම සඳහා ලබා දුන් අවසරය අවලංගු කිරීමට එරෙහිව රු.මිලියන 70ක වන්දියක් ඉල්ලා 2014 වර්ෂයේදී නඩු පවරා තිබුණි. මෙම ඉදි කිරීමට අදාළ විෂය ලිපි ගොනුව ඉදිරිපත් කරන ලෙස 2023 වර්ෂයේදී ගරු අධිකරණය විසින් නියෝග කර තිබුණ ද, එය අස්ථානගත වී ඇති බවට සභාව විසින් අධිකරණය වෙත දන්වා තිබුණි. | ලිපිගොනුව අස්ථානගතවීම සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් පැවැත්වීමට අවශ්‍ය කටයුතු කරන බව දන්වමි. | මූලික විමර්ශනයක් කළ යුතු වේ. |

## 3.3 දෘෂ්‍ය අක්‍රමිකතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| විෂය නිලධාරිණිය විසින් ඉන්ධන බිල්පත් පියවීමේදී කූට ලේඛන සකස් කර 2023 මැයි සිට 2024 ජනවාරි දක්වා කාලය තුළ රු.2,227,400ක පමණ මූල්‍ය අක්‍රමිකතාවක් සිදුකර ඇති බව ඒ සඳහා පත් කළ මූලික විමර්ශන කමිටුව වාර්තා කර තිබුණි. අභ්‍යන්තර වැඩ බෙදීමක් නොමැති වීම මීට හේතුව වී තිබුණි. වවුචර් සමග වූ ඉන්ධන ඇණවුම් සියල්ල විකෘති කර ඇති බව ඉතා පැහැදිලි වුවත්, එම වවුචර් පරීක්ෂා කරන, නිර්දේශ කරන, අනුමත කරන හා ගෙවීම් සහතික කරන නිලධාරීන් ඒ පිළිබඳ නොසලකා හැර කටයුතු කර තිබීම ප්‍රශ්නගත විය. | මේ පිළිබඳව මූලික විමර්ශනයක් හා පොලිස් විශේෂ අපරාධ විමර්ශන ඒකකය මඟින් පරීක්ෂණයක් පැවැත්වෙන බැවින් එම පරීක්ෂණ වාර්තා මත පදනම්ව ඉදිරි කටයුතු කරමි. අභ්‍යන්තර පාලන ක්‍රමයක් ස්ථාපිත කිරීමට කටයුතු කරමි. | මේ සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කළ යුතු අතර විධිමත් අභ්‍යන්තර පාලනයක් ස්ථාපිත කළ යුතු වේ. |

## 3.4 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2006 වර්ෂයේදී සභාව විසින් අයුතු ලෙස පෞද්ගලික ඉඩමක් හරහා මාර්ගයක් ඉදිකිරීමට එරෙහිව පවරන ලද නඩුවක තීන්දුව ලෙස, පැමිණිලිකාරියට එම ඉඩමේ නිරවුල් භුක්තිය නැවත ලබා දී තිබුණු අතර වන්දි මුදල්, නඩු ගාස්තු හා නීතිඥ ගාස්තු ලෙස රු.479,505ක් 2022 වර්ෂයේ දී ගෙවීමට සභාවට සිදු වී තිබුණි. මාර්ගය ඉදිකිරීමේදී නොසැලකිලිමත් ලෙස කටයුතු කළ පාර්ශවයන්ගෙන් එම මුදල් අයකර ගැනීමට 2023 දෙසැම්බර් වන විටත් කටයුතු කර නොතිබුණි. | මේ වන විට මු.රෙ.104 අනුව පරීක්ෂණයක් සිදු කරමින් පවතියි. | නොසැලකිලිමත්ව කටයුතු කළ පාර්ශවවලින් එම මුදල් අය කළ යුතු වේ. |

## 3.5 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සභාව සතු තේ ඉඩමක් සංවර්ධනය කර පැල සිටුවීමට රු.732,000ක් වැය කළ ද, ඉඩම නිසි ලෙස සංවර්ධනය කර නැති බවත්, තේ පැල පාළු වී ඇති බවත් තේ සංවර්ධන අධිකාරිය විසින් දන්වා තිබුණි. | මෙම ඉඩම අවුරුදු ගණනාවක් තිස්සේ වනාන්තරයක් ලෙස පැවැතුණි. එහි පැවැති ගල් වැටි ගැල වී ඇති අතර, එම සියලු අඩුපාඩු මේ වන විට අවසන් කර අවසන් බිල්පත ගෙවා ඇත. | වැය කළ මුදලට ප්‍රමාණවත් ප්‍රතිලාභයක් ලැබිය යුතු වේ. |

**3.6 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| වේවැල්කැටියේ ක්‍රීඩාංගනයක 2021 වර්ෂයේදී Green Light 08ක් සවිකර තිබුණ ද, ඒවායේ බල්බ නොතිබුණු බැවින් දරන ලද රු.184,000ක් නිෂ්ඵල වියදමක් වී තිබුණි. එම බල්බ අස්ථානගත වීම සම්බන්ධයෙන් කිසිදු පියවරක් ද ගෙන නොතිබුණි. එමෙන්ම, සත්‍ය යන්ත්‍ර පැය පිළිබඳ සැලකිළිමත් නොවී මාර්ගයක් කැපීමට රු.82,500ක් ගෙවා තිබුණි. | බල්බ අස්ථානගත වීම සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් පැවැත්වීමට කටයුතු කරමි. එමෙන්ම, ක්‍රීඩා පිටිය ඉදිරිපස කොටස කණ්ඩිය කපා එම පස් පහළින් ඇති ඉවුර දෙසට ගෙන ගොස් තලා මට්ටම් කල බව කාර්මික නිලධාරි වාර්තා කර ඇත. | මෙම සිද්ධීන් සම්බන්ධයෙන් විමර්ශනයක් කළ යුතු වේ. |

**3.7 වාහන පද්ධතිය කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | කම්පැක්ටර් රථය සඳහා කිලෝමීටර් 35,000ක වගකීම් කාලයක් සහිත ටයර් 06ක් සවිකර තිබුණ ද, කිලෝමීටර් 16,830ක් ධාවනය කිරීමෙන් පසු ඒවා ඉවත් කර තිබුණි. | ටයර් මීලදීගත් ආයතනයෙන් මේ පිළිබඳව විමසීම් කර ඉදිරි කටයුතු කරමි. | පරීක්ෂණ පවත්වා වගකීම නිශ්චය කළ යුතු වේ. |
| (ආ) | 2023 වර්ෂයේදී අනතුරට පත් කම්පැක්ටර් රථය අලුත්වැඩියා කිරීම ඵලදායී නොවන බව යාන්ත්‍රික ඉංජිනේරු විසින් දන්වා තිබුණි. එහි රියදුරුගේ බලපත්‍රය කල් ඉකුත් වී තිබීම නිසා රක්ෂණ වන්දි ලබාදීම ප්‍රතික්ෂේප කර තිබුණි. ඒ අනුව, මේ දක්වා ගෙවා තිබුණු රක්ෂණ වාරික මුදල් ද නිෂ්ඵල වියදමක් වී තිබුණි. මෙම රථය බාහිර ස්ථානයක ගාල් කර තිබුණු අතර එහි යතුර හා අමතර යතුරු ද රියැදුරු භාරයේ පැවැතිණි. කසළ ගාස්තු එකතු කිරීම ද රියැදුරු විසින් ම සිදුකර ඇති අතර අනතුර සමග රු.213,000ක් වූ කුවිතාන්සි පොත් 02ක් ද අස්ථානගත වී තිබුණි. | රියදුරු බලපත්‍රයේ කල් ඉකුත් වීම සම්බන්ධයෙන් අවධානයෙන් සිට රියදුරන් දැනුවත් කිරීමට විෂයය නිලධාරින්ට උපදෙස් ලබා දී ඇත. සේවය අවසන් වූ පසු සියළුම වාහන සහා භූමියේ ගාල් කිරීමටත්, යතුරු සහා කාර්යාලයේ තැබීමටත් දැනුම් දී ඇති අතර එම කටයුතු අධීක්ෂණයට නිලධාරින් පත් කර ඇත. | පරීක්ෂණ පවත්වා වගකීම නිශ්චය කළ යුතු වේ. |
| (ඇ) | ධාවනය කළ නොහැකි තත්ත්වයේ පැවති වාහන 08ක් සහ ට්‍රැක්ටර් ටේලර් 04ක් අපහරණය කර නොතිබුණි. | මෙම වාහන වෙන්දේසි කිරීමට කටයුතු කර තිබුණු නමුත් වෙන්දේසි වී නොමැත. නැවත කමිටුවක් පත් කර අපහරණ කටයුතු සිදු කරමින් පවතී. | වත්කම් අභාවිතව නොතැබිය යුතු වේ. |